# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/322/2019 (NPC)**

එම්.කේ.එම්.ෆාහිම්

**අභියාචක**

**එදිරිව,**

පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2025.09.09**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.

අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා

වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

**-<u>නියෝගය</u>-**

දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දුනිමු. එකී දෙපාර්ශවයම ඉදිරිපත් කරන ලද කරුණුද, මෙම අභියාචනය සම්බන්ධයෙන් ලිඛිතව ඉදිරිපත් කර ඇති අනෙකුත් සියළුම ලේඛනවල ඇතුළත් කරුණුද පරීක්ෂා කර බලමු. අභියාචක වන එම්.කේ.එම්.ෆාහිම් යන අය විසින් 2019.12.16 දිනැතිව මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති, අභියාචනයෙන් ඉල්ලා ඇත්තේ, ඔහුට එරෙහිව නිකුත් කර ඇති ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණය සහ විනය නියෝගය නිෂ්ප්‍රභා කර අහෝසි කර දෙන ලෙසයි. අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති විනය නියෝගය 2018.06.14 දිනැති ලිපිය මඟින් උතුරු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් නිකුත් කර ඇත. ඒ මඟින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ දෙවන චෝදනාව සඳහා ඔහු වරදකරු කරමින්, එක් වැටුප් වර්ධකයක් විලම්භනය කර, අභියාචක වැඩ තහනමට ලක් කර සිටි කාලය සඳහා වැටුප්

නොගෙවීමට තීරණය කර ඇත. එකී විනය නියෝගය ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2019.11.05 දිනැති ලිපිය මඟින් ස්ථිර කරමින් අභියාචක විසින් එම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභා කර ඇත.

ඉහතින් සඳහන් දඬුවම නියම කර ඇත්තේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා හතරෙන්, දෙවන චෝදනාවට අභියාචක වරදකරු කිරීම හේතුවෙනි. ඔහුට විරුද්ධව ඉදිරිපත් කර තිබූ දෙවන චෝදනාව වන්නේ, අභියාචක කිළිනොච්චිය පොලිස් ස්ථානයට අනුයුක්තව සිටියදී බැරැක්ක රෙගුලාසි වල සඳහන් අංක ඊ 02 දරන දෙපාර්තමේන්තු නියෝගයේ විධි විධානයන්ට පටහැනිව 2016.11.01 වන දින පැය 21.00 පසුව අනවසරයෙන් නේවාසික බැරැක්කයෙන් බැහැරව ගොස් තිබීමයි. එම චෝදනාවෙහි වැඩිදුරටත් සඳහන් වන්නේ උසස් නිළධාරියකු විසින් ලියවිල්ලකින් හෝ අන්‍ය ආකාරයකින් නිකුත් කළ, යම් නියෝගයට අකීකරුවීම හෝ එම නියෝගය ඉටු කිරීම, පැහැර හැරීම හෝ අතපසු කිරීම යන වරද සිදු කර ඇති බවයි.

දෙපාර්ශවයම පිළිගෙන ඇති පරිදි 2016.11.01 දින අභියාචක ඇතුළු අට දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක්, කිසියම් තොරතුරක් මත විමර්ශනයක් පැවැත්වීම සඳහා පොලිස් ස්ථානයෙන් බැහැරව ගොස් ඇත. එසේ බැහැරව යාම පැය 21.00න් පසුව සිදු වීමත්, ඒ වන විට අභියාචක බැරැක්කය තුළ සිටිය යුතු වීමත් යන දෑ ද, පාර්ශවකරුවන් විසින් පිළිගන්නා ලද කරුණු වේ. එසේ නම් ඉහතින් සඳහන් රෙගුලාසි ප්‍රකාරව, අභියාචක මේ අවස්ථාවේදී බැරැක්කයෙන් බැහැරව ගොස් සිටියේ නම්, ඔහු විසින් ඒ සම්බන්ධයෙන් සටහනක් යෙදිය යුතුව තිබුණි.

අභියාචක දන්වා සිටින්නේ, ඔහු විසින් ස්ථානයෙන් බැහැරවයාම සම්බන්ධයෙන් ලිඛිතව සටහනක් නොදැම්මද, ඒ සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයා විසින් නියමාකාරයෙන් සටහන් යොදා ඇති බවයි. අභියාචකට විරුද්ධව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේදී, එවකට ස්ථානාධිපතිවරයාව සිටි ඉන්ද්‍රසේන ඉන්දු පෙරදීපන් යන අය විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ සාක්ෂියට විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදී. එහි මෙසේ සඳහන් වේ.

**"එම දිනය 2016.11.01 වන දිනයි. ඒ අනුව එම තොරතුර සාර්ථක නම් මා හට වැටලීමට යාමට දැනුම් දෙන ලෙස මා විසින් පවසා නින්දට ගියා. පසුදින උදෑසන පැය 12.00 පැය 01.30ත් අතර සෝමරත්න නිළධාරියා පෙර කී දැව පටවාගත් රථය සාර්ථක තොරතුරක් බවත්, එය වැටලීම් කිරීමට යාමට අවශ්‍ය බවත් දැනුම් දී සිටියා. ඒ වන විට වර්ෂාව සහිත කාලගුණ තත්ත්වයක් තිබුණු අතර, සෝමරත්න නිළධාරියාට නිළධාරීන් සූදානම් කරන ලෙස දැනුම් දී වැටලීම සඳහා පිටවීමේ සටහන් මා විසින් යොදන අවස්ථාවේදී වැටලීම සඳහා නිළධාරීන් කණ්ඩායමක් එම ස්ථානයට පැමිණියා. ඒ අනුව ඉක්මනින් අප ස්ථානගත විය යුතු බව දැන්වීම නිසා පිටවීමේ සටහන් පසුව යෙදීමට තබා මා වහාම නිළධාරීන් සමඟ ඔසාකා ලී මෝල අවට නිළධාරීන් ස්ථානගත කළා. පො.කො. 79758 සෝමරත්න නිළධාරියා පවසා සිටියා අක්කරායන්කුලම් ප්‍රදේශයේ කොට පටවා ගැනීමට කැබ් රථයක් අක්කරායන්කුලම් වැවට ඇතුල්කර ඇති බවත්, ඒ බවට ඔහුට දැනුම් දුන් තොරතුරුකරුගේ ජංගම දුරකථනය ක්‍රියාවිරහිත වී ඇති නිසා අක්කරායන්කුලම් වෙත ගොස් ඔහු දැනුවත් කර කනගපුරම් ඔසාකා ලී මෝල අසලට පැමිණෙන බව දැනුම් දී පිටට ගිය අතර, පසුව මා ස්ථානය පැමිණ තොරතුරු සටහන් පොතේ පිටවීම් සටහන සම්පූර්ණ කළා. (පැ.04 ලෙස සලකුණු කර ඇති කරුණු සත්‍ය බවත්, විනිශ්චය සභාවට වලංගු බවත්, මා පිළි ගන්නවා.''**

එම සාක්ෂිය ලබා දී ඇති පොලිස් ස්ථානාධිපතිවරයාගේ නියෝග පිලිපැදීමට, අභියාචක ඇතුළු ඔහු යටතේ සිටි නිළධාරීන් යටත් වනවා ඇත. එම සාක්ෂියෙන් වැඩිදුරටත් සනාථ වන්නේ එම අවස්ථාවේ ඇති ස්වභාවය සහ අවශ්‍යතාවයේ වැදගත්කම සලකා බැලීමෙන් පසු, ස්ථානාධිපතිවරයා විසින් මෙම අභියාචක ඇතුළු අනෙක් නිළධාරීන්ට සිද්ධිය සිදු වූ ස්ථානයට පිටව යාමට නියෝග නිකුත් කර ඇති බවයි. ඒ සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයා විසින් සටහන් යෙදූ බවටද මෙහි පැහැදිළිව සඳහන් වේ.

මෙම තත්ත්වය යටතේ අභියාචක විසින් සටහන් නොතබා බැරැක්කයෙන් බැහැරව ගොස් සිටියත්, ඉහත සාක්ෂිය අනුව පෙනී යන්නේ එම අවසරය ස්ථානාධිපතිවරයා විසින් වාචිකව අභියාචකට ලබා දී ඇති බවයි. එවැනි තත්ත්වයක් යටතේ ඉහතින් සඳහන් රෙගුලාසි කඩවීමක් සිදු වන බවට

තීරණය කළ නොහැකිය. එම කරුණු සළකා බලා අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා වලින් අභියාචක නිදහස් කිරීමට තීරණය කරමු.

මෙම තීරණය හේතුවෙන් අභියාචකට එරෙහිව 2018.06.14 වන දිනැති ව උතුරු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් නිකුත් කර ඇති විනය නියෝගයේ පළවන දඬුවම ඉවත් කිරීමට තීරණය කරමු.

කෙසේ වෙතත් අභියාචක වැඩ තහනමට ලක් කර සිටි කාලය තුළ ඔහු සක්‍රීය සේවයේ නියුතුව නොසිටි බැවින්, එම කාලය සඳහා අභියාචකට හිඟ වැටුප් හිමි නොවිය යුතුය.

මෙම නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා නිසි පියවර ගන්නා ලෙස ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු. එකී කරුණු සලකා බලා ඉහත සඳහන් කොන්දේසියට යටත්ව, අභියාචක ඉදිරිපත් කර ඇති අභියාචනයට අවසර දීමට තීරණය කරමු.

අභියාචනයට ඉඩ දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/-